කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/SM/2020/01

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2020.02.24

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉටු කරවා ගැනීමට අපේක්ෂිත ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුවලට සහභාගී වන මෙම දෙපාර්තමේන්තුවේ නියෝජිතයින් මගින් එම කමිටු රැස්වීම් වලදී සාකච්ඡාවට භාජනය වන ඉහත මාතෘකාවට අදාල ගැටළු කිහිපයක් පහතින් සඳහන් වන අතර ඒ සඳහා ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

i. විවිධ රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් තම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් / ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ක්‍රියාත්මක කරවා ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපෘති සඳහා බොහෝ විට වර්ෂයේ අග භාගයේදී (ඔක්තෝම්බර් මසටද පසුව) ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කාලය ප්‍රමාණවත් නොවීමෙන් විවිධ දුෂ්කරතාවලට මුහුණදීමට සිදුවීම හා අක්මුදල් ලබා ගැනීමට අපහසු වීම.

ii. ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන වෙන් කර යැවීමේදී මුළු ව්‍යාපෘතියට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදන එකවර වෙන්කර නොයැවීමෙන් ප්‍රසම්පාදන කටයුතුවලට හා ගිවිසුම්වලට එළඹීමට බාධා සිදු වීම.

iii. හඳුනාගත් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දුන්නද නැවත නැවතත් ව්‍යාපෘති සංශෝධනය කිරීමෙන් දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදුවීම.

iv. ඇතැම්විට අවශ්‍යතා හඳුනාගෙන නිශ්චිතව ප්‍රතිපාදන වෙන් නොකිරීමෙන් සම්පත් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය වීම.

02. එම නිරීක්ෂණය වූ ගැටළු සහගත තත්වයන් වළකා ගැනීම සඳහා පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

i. ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය විසින් සෑම වර්ෂයකම වාර්ෂික අයවැය ප්‍රතිපාදන හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදහස් කරන්නේ නම් ඒ සඳහා වූ ව්‍යාපෘති අනුමත කර මුදල් වර්ෂයේ පළමු කාර්තුව තුළ හෝ දෙවන කාර්තුව ආරම්භයේදී අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන්කර දීම.


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

ii. දිස්ත්‍රික් ලේකම්වරුන්ට ප්‍රසම්පාදන කටයුතු හා ගිවිසුම්වලට එළඹීම පහසු වීම සඳහා ඒ ඒ ව්‍යාපෘතිය යටතේ වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා මුළු ප්‍රතිපාදන ප්‍රමාණය එකවර වෙන්කර දීමට කටයුතු කිරීම. කිසියම් හේතුවක් මත මුළු ප්‍රතිපාදන ප්‍රමාණය එකවර වෙන්කර දීමට නොහැකි නම්, ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය වෙන්කර දෙන බවට පිළිගත හැකි ලිඛිත තහවුරුවක් ලබා දීම.

iii. ඔබ විසින් අනුමත කර දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන වෙන්කර දෙනු ලබන ව්‍යාපෘති නැවත නැවතත් වෙනස් කිරීම අවම කිරීම තුළින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මුහුණ දෙන විවිධ දුෂ්කරතා අවම කර ගැනීමට කටයුතු කිරීම.

iv. එක් එක් ක්‍රියාකාරකම්වල අවශ්‍යතා නිශ්චිතව හඳුනාගෙන නිවැරදි ප්‍රතිපාදන ප්‍රමාණය පමණක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන්කර දීම තුළින් සම්පත් නිශ්කාර්යව පැවතීම වළකා ගැනීමට කටයුතු කිරීම.

v. තවද ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන්කර දෙන ප්‍රතිපාදනවලට අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීම තුළින් වසර අවසානයේ අනවශ්‍ය ප්‍රතිපාදන ඉතිරිවීම් වළකා ගැනීමට හා එකී ඉතිරි ප්‍රතිපාදන වෙනත් ඵලදායි ව්‍යාපෘති සඳහා වෙන්කිරීමට කටයුතු කිරීම.

03. ඉහත නිර්දේශ නිසි පරිදි ක්‍රියාත්මක කිරීම තුළින් රටේ සියලුම අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන දිස්ත්‍රික් ලේකම්වරුන් මුහුණපාන විවිධ දුෂ්කරතා සහ විගණන විමසුම්ද අවම කර ගැනීමට හැකි වනු ඇත.

04. මේ පිළිබඳව ඔබගේ අවධානය යොමුවනු ඇතැයි ගෞරවයෙන් අපේක්ෂා කරමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 1. විගණකාධිපති - දැ.ගැ.ස
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - දැ.ගැ.ස